අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/05/67/28/06 (III වෙළුම) ඔබේ යොමුව / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 2023.05. 17

සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්/ විදුහල්පතිවරුන් /

පීඨාධිපතිවරුන්/ ගුරු විදුහල්පතිවරුන්/

ගුරුමධ්‍යස්ථාන කළමනාකාරවරුන්,

<u>ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ සහ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවක ගණයේ කාර්යක්ෂමතා කඩඉම 2022(II) සඳහා අයදුම්පත් කැඳවීම</u>

ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ (PL1), ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවක ගණයේ (PL2) සහ ප්‍රාථමික ශිල්පීය සේවක ගණයේ (PL3) කාර්යක්ෂමතා කඩඉම 2022(II) විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව මේ සමඟ අමුණා ඇති ආකෘති අංක 02 පරිදි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවලට පෙනී සිටීම සඳහා වන අයදුම්පත් යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

02. ඊට අදාළ විෂය නිර්දේශයන් ඇමුණුම 01 හි දක්වා ඇති පරිදි වේ. පෙර වර්ෂවලදී පවත්වන ලද කාර්යක්ෂමතා කඩඉම් අසමත් වූ සහ එම අවස්ථාවලදී පෙනී සිටීමට නොහැකි වූ සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකි වේ. තවද ශ්‍රේණිගත උසස්වීම් ලද සේවකයින්හට තමා උසස්වීම් ලබා ඇති ශ්‍රේණියට අදාළ කඩඉමටද පෙනී සිටීම සඳහා අයදුම්කළ හැකි අතර නව පත්වීම්ලාභීන් ද I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පෙනී සිටිය යුතු වේ. මේ සමඟ ඇති ඇමුණුම 3 හි ඇතුළත් ආකෘතිය පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2023.06.15 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ලැබීමට සලස්වන ලෙස කාරුණිකව දන්වමි.

03. අයදුම්පත් යොමු කරන ලිපි කවරය පහත සඳහන් ආකෘතිය පරිදි වියයුතු බවද කාරුණිකව සලකන්න.

| |
|---|
| ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ සහ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවක ගණයේ කාර්යක්ෂමතා කඩඉම 2022(II)<br><br>ලේකම්,<br>අධ්‍යාපන අමාත්‍යාංශය,<br>ඉසුරුපාය,<br>බත්තරමුල්ල. |

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister +94112784832 +94112784825 education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary +94112784811 +94112785162 secretary.education@moe.gov.lk

03.පහත සඳහන් පරිදි කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කරන ලද තනතුරුධාරීන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා ඉල්ලුම් කිරීම අවශ්‍ය නොවන බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

- I වන කාර්යක්ෂමතා කඩඉම සමත් III වන ශ්‍රේණියේ තනතුරුධාරීන්
- II වන කාර්යක්ෂමතා කඩඉම සමත් II වන ශ්‍රේණියේ තනතුරුධාරීන්
- III වන කාර්යක්ෂමතා කඩඉම සමත් I වන ශ්‍රේණියේ තනතුරුධාරීන්

04. සේවා සහායක - රසායනාගාර හා සේවා සහායක - පුස්තකාල පත්වීම් ලද නිලධාරීන් තමාගේ වර්තමාන ශ්‍රේණියට අදාල කුමන හෝ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකට පෙනී සිට සමත් වී ඇත්නම් නැවත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අයදුම් කිරීම අවශ්‍ය නොවේ.

ආර්.බී. ගන්කේවල
අතිරේක ලේකම් (අනධ්‍යන හා ඒකාබද්ධ සේවා)
ලේකම් වෙනුවට

පිටපත්-

01. ප්‍රධාන කොමසාරිස් / ගුරු අධ්‍යාපන පරිපාලන - කරු.දැ.ගැ.ස.
02. සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - කරු.දැ.ගැ.ස.